# පුවත්පත් මාධ්‍ය ආචාරධර්ම සම්බන්ධ පුවත්පත් කතුවරුන්ගේ දැනුම්වත්භාවය විමසා බැලීම

Faculty of Social Sciences
University of Kelaniya
Sri Lanka

*කේ. ජී. ඩී. කුමාරි*[1]
*විජයානන්ද රූපසිංහ*[2]

සංක්ෂේපය

දියුණු තාක්ෂණය හමුවේ වුවද මුද්‍රිත සන්නිවේදනයට තවමත් විශේෂ ස්ථානයක් පවතී. ඒ අතර පුවත්පත් මාධ්‍යය වැදගත් වේ. මේවායේ කතුවරුන් තමන්ට අභිමත පරිදි ලිපි හෝ වාර්තා සම්පාදනය කළහොත් ඒවා සමාජයේ අගතියට හේතුවේ. සන්නිවේදන මාධ්‍යයක අරමුණ විය යුත්තේ සමාජයට වැදගත් තොරතුරු සම්පාදනය කිරීමයි. ආචාරධර්ම තුළින් ඇති කරනුයේ ප්‍රමිතීන්ය. එබැවින් ආරම්භයේ සිටම එකිනෙකාගේ පරස්පර විරෝධී අදහස් සමතුලිත කිරීම සඳහා විවිධ ආචාරධර්ම පැනවීම සිදු විය. වර්තමානයේ පුවත්පත් කතුවරුන් අනුගමනය කරන ප්‍රධාන මාධ්‍ය ආචාරධර්ම පද්ධති දෙක වනුයේ 1981 ගැසට් පත්‍රය සහ වෘත්තීය ප්‍රතිපත්ති මාලාවයි. මාධ්‍යකරණයේදී පුවත්පත් මාධ්‍යයට අදාළව පවතින මාධ්‍ය ආචාරධර්ම පිළිබඳ කතුවරුන්ගේ දැනුම්වත්භාවය විමසා බැලීම මෙම අධ්‍යයනයේ මූලික අරමුණ වේ. එමෙන්ම පුවත්පත හා සම්බන්ධ වර්තමාන මාධ්‍ය ආචාරධර්ම පද්ධති වෙනස් විය යුතුද? යන්න විමසා බැලීමත් මෙම අධ්‍යයනය මගින් විමසා බලන ලදි.මෙම අධ්‍යයනයේදී පර්යේෂණ ගැටලුව වූයේ, කතුවරුන් වාර්තාකරණයේදී පවතින මාධ්‍ය ආචාරධර්ම පිළිබඳව දැනුම්වත්ද? යන්න සොයා බැලීමයි. පර්යේෂණ ගැටලුවට අදාළව ගොඩ නගා ගන්නා ලද උපන්‍යාසය වූයේ, පුවත්පත් කතුවරුන්ගේ මාධ්‍ය ආචාරධර්ම පිළිබඳ දැනුම්වත්භාවය අඩු අතර ඒ නිසාම පුවත්පත්වල මාධ්‍ය ආචාරධර්ම කඩවීම් ඉහළ අගයක් ගන්නා බවයි. මෙහිදී පර්යේෂණ ක්‍රමය ලෙස සමීක්ෂණ ක්‍රමය යොදා ගත්තේය. ප්‍රාථමික දත්ත රැස් කිරීමේ ක්‍රමවේදයන් ලෙස ප්‍රශ්නාවලි හා සම්මුඛ සාකච්ඡා යොදා ගත්හ. පර්යේෂණයට අදාළව තෝරාගත් 2015 මාර්තු මාසයේ සිංහල පුවත්පත්වල මුල් පිටු ආශ්‍රිතව ගුණාත්මකව අන්තර්ගත විශ්ලේෂණයක් ද සිදු කරන ලදි. මෙම අධ්‍යයනය තුළින් ලබාගත් පොදු නිගමනය වන්නේ පුවත්පත් කතුවරුන් මාධ්‍ය ආචාරධර්ම පිළිබඳව දැනුම්වත් වුවද ඒවා අනුගමනය නොකරන බවයි. එසේම වර්තමානයට ගැළපෙන පරිදි පුවත්පත් මාධ්‍ය ආචාරධර්ම පද්ධතියක් සකස් විය යුතු බව ද සොයා ගැනීමට හැකි විය.

ප්‍රමුඛ පද - මාධ්‍ය, ආචාරධර්ම, දැනුම්වත්භාවය, කතුවරුන්, පාඨකයින්

*1 ජන සන්නිවේදනය, ජන සන්නිවේදන අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව , disnabeliatta@gmail.com*

*2 ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, ජන සන්නිවේදන අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව*